# වසර 20 ක් සපුරන

# ජාතික රූපවාහිනියේ ගමන් මග

*ඕනෑම රටක රූපවාහිනිය බොහොම ප්‍රබල මාධ්‍යයක්. අපේ රටේ තත්ත්වයත් එහෙම යි. හැබැයි ඇතැම් රටවල රූපවාහිනී නාලිකා හා අපේ රටේ නාලිකා අතර වෙනස්කම් තිබෙනවා. උදාහරණයක් වශයෙන් ඇමරිකාවේ පාසල් ජීවිතයෙන් සමු ගන්න දරුවෙක් මත් ද්‍රව්‍ය, වෙඩි තැබීම්, මිනී මැරුම් දූෂණ වැනි ක්‍රියා ඇතුළත් දර්ශන පැය 20,000ක් (ටෙලිවිෂන් පැය) පමණ නරඹා තිබෙනවා. අපේ රටේ ළමයකුගේ තත්ත්වය එච්චරම නරක නැහැ.*

## රූපවාහිනිය

විසි වසරක් සපුරමින් භද්‍ර යෞවනයට පියමනින ජාතික රූපවාහිනිය විසි එක්වැනි සියවසට මුහුණ දෙන්නේ කෙලෙසදැයි කියා අප පළමුවෙන් විමසුවේ ජාතික රූපවාහිනියේ සභාපති උපාලි ගුණරත්න මහතාගෙනුයි.

"ඕනෑම රටක රූපවාහිනිය බොහොම ප්‍රබල මාධ්‍යයක්. අපේ රටේ තත්ත්වයත් එහෙම යි. හැබැයි ඇතැම් රටවල රූපවාහිනී නාලිකා හා අපේ රටේ නාලිකා අතර වෙනස්කම් තිබෙනවා. උදාහරණයක් වශයෙන් ඇමරිකාවේ පාසල් ජීවිතයෙන් සමු ගන්න දරුවෙක් මත් ද්‍රව්‍ය, වෙඩි තැබීම්, මිනී මැරුම් දූෂණ වැනි ක්‍රියා ඇතුළත් දර්ශන පැය 20,000ක් (ටෙලිවිෂන් පැය) පමණ නරඹා තිබෙනවා. අපේ රටේ ළමයකුගේ තත්ත්වය එච්චරම නරක නැහැ.

මට දැනගන්න ලැබුණ ළඟදි ඉන්දියාවේ ළමුන් පිරිසක් බැට්මෑන් අනුගමනය කරන්නට ගොසින් අතපය කඩාගත් බව. මං මේ උදාහරණයෙන් පෙන්වූවේ රූපවාහිනී දර්ශන ජීවිතයට කාවදින බවයි. එහෙම නම් ජනතාවගේ ජීවිතය හැඩගස්වන්නත් රූපවාහිනිය යොදාගත හැකියි.



ජාතික රූපවාහිනී සංස්ථාවේ සභාපති
උපාලි ගුණරත්න මහතා

## ආකල්පවල වෙනසක් ඕනෑ

**දැනට එවැනි මෙහෙයක් වෙනවා ද?**

තවමත් එවැනි ලොකු මෙහෙවරක් වෙන්නෙ නැහැ. ඒ මෙහෙවර කිරීමට තමයි අප යොමුවිය යුත්තේ. මං විශ්වාස කරනවා ජනතාවගේ ආකල්ප වෙනසක් ඇති කිරීමට රූපවාහිනිය මුල්විය යුතුයි කියා.

**කුමන ආකාරයේ වෙනසක් ද?**


දැන් බලන්න රූපවාහිනී නාලිකාවල ප්‍රචාරය වන ටෙලිනාට්‍ය දිහා.

එක්කෝ බොහොම පසුගාමී කතා. ප්‍රශ්නයකදී දිවිනසා ගන්න එක තමයි හුඟක් කතාවල පිළිතුර. ජපානය වගෙ රටවල මේ වගේ කථා පෙන්වන්න ඉඩ දෙන්නෙ නැහැ.

තැන්නම් හාම්පුතාට විරුද්ධව සේවකයා මෙහෙයවන ස්වාමියාට විරුද්ධව බිරිඳ මෙහෙයවන කතා තමයි ප්‍රචාරය වන්නෙ. විශේෂයෙන්ම රටක පාලකයන්ට විරුද්ධව ජනතාව මෙහෙයවනු ලැබුවොත් රට කඩා වැටෙනවා. කොන්ෆියුසියස් පවසා තිබෙනවා රටක පාලකයන් ගැන විශ්වාසය බිඳ දැමුවොත් රට බිඳවැටෙනවා කියා. ඇයි මාධ්‍යවලට නරක හොයන්නෙ නැතිව හොඳ හොයන්න බැරි. ජීවිතයේ ලස්සන පැත්තක් තිබෙනවා. ඇයි මේ මාධ්‍ය ඒ ලස්සන නොදකින්නෙ? මං නම් ජීවිතයේ හොඳ පැත්ත දකින්නට සලස්වනවා. ඒ විදිහටයි ජීවිතය ගැන ආකල්ප වෙනස් කරවන්නෙ.

**ඉදිරි කාලය තුළ රූපවාහිනියේ ගමන්මග කෙබඳු වෙයි ද?**

තාක්ෂණික අතින් මෙන්ම වැඩසටහන් විවිධත්වය අතින් ද ලොකු ගමනක් යන්න බලාපොරොත්තු වෙනවා. දැනට හොඳම තාක්ෂණය සතු අපටයි. පොදුවේ හැම වැඩසටහනකම ගුණාත්මක බව වර්ධනය කරන්නටත් විශේෂයෙන්ම ළමා වැඩසටහන් ගැන අවධානය යොමුකරන්නටත් මං බලාපොරොත්තු වෙනවා. උදාහරණ වශයෙන් ගුරුගෙදර අධ්‍යාපන වැඩසටහනට මීට පෙර තිබුනෙ සතියට එක් දිනයයි. දැන් සතියට දින දෙකක් එය පැවැත් වෙනවා. විසි එක්වැනි සියවසට ඔබින පරිගණක, ඉන්ටර්නෙට් වැඩසටහන් රැසක් ම ඉදිරිපත් කිරීමට බලාපෙරොත්තු වෙනවා. අපේ නව ඇමතිවරයා වන අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමාගේ මගපෙන්වීම යටතේ ලොකු ශක්තියක් අපට ලැබෙනෙවා. මේ ඉදිරි ගමන යන්නට.



රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ ජෙනරාල් අශෝක පීරිස් මහතා

## මාධ්‍ය ප්‍රබල නිසා ඇතිවන බලපෑම විශාලයි

**රූපවාහිනිය සදාචාරයට ප්‍රබල බලපෑමක් ඇතිකරන බවට මතයක් ගොඩනැගී තිබෙනවා. ජාතික රූපවාහිනියේ ඉහළම පරිපාලන නිලධාරියා වශයෙන් ඔබ මීට එකඟ වෙනවා ද?**

අනිවාර්යයෙන්ම බලපෑමක් වෙනවා. මෙය අනිත් මාධ්‍යයන්ට වඩා ප්‍රබලයි. වචන පමණක් නොව රූපද තිබෙනවා. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයක් දෘශ්‍ය හෝ ශ්‍රව්‍ය මාධ්‍යයකට වඩා ප්‍රබලයි. මෑතකදී කැනඩාවේ දරුවකු තුවක්කුවකින් තව කෙනෙකුට වෙඩි තැබුවා. නීතිය අනුව ළමයාට දඬුවම් කරන්න බැරි වුණා. විනිසුරුතුමකු කීවා දඬුවම් දිය යුත්තේ රූපවාහිනියට බව. කෑගල්ලේත් මෙවැනි දෙයක් වුණා. අක්ක කෙනෙකුයි මල්ලි කෙනෙකුයි සෙල්ලම් කර කර ඉඳල තිබෙනවා. හදිසියෙම මල්ලි ගේ ඇතුළට ගියා. යළි නොආ නිසා අක්කා ගොස් බැලුවා. මල්ලී කඹයකින් එල්ලී මැරිලා. පස්සෙ තඩුවිභාගයකදී හෙළිවුනා පෙරදා ඒ දරුවා රූපවාහිනියෙන් (පෞද්ගලික) නැරඹූ හින්දි චිත්‍රපටියක මෙවැනි සිද්ධියක් තිබූ බව. හොඳ පැත්තට සිදුවූ බලපෑම් ද තිබෙනවා. අපේ සාරධර්ම ගැන සිහිපත් කෙරෙන වැඩසටහන් ජාතික රූපවාහිනියෙන් ප්‍රචාරය වෙනවා. පරිසරය සුරැකීමේ වැඩසටහන්වලිනුත් ලොකු ප්‍රයෝජනයක් ලැබෙනවා. සිරිපාද සමයේදී ඇතිවන ලොකුම ප්‍රශ්නය වන්නේ පොලිතින්. මේ පොලිතින් ගැටලුව ගැන 9.05 වැඩසටහනෙන් අප ජනතාව දැනුවත් කළා.

රාගතිශ්‍රිත දර්ශන ඇතැම් නාලිකාවල ප්‍රචාරය වෙනවා. ඒ වගේම ලිංගික කටයුතු සාකච්ඡා කරන වැඩසටහන් ද ප්‍රචාරය වෙනවා. මේවා ඔවුන් ප්‍රචාරය කරන්නේ රාත්‍රී කාලයේ. ඔවුන් හිතනවා ඇත්තේ මේවා වැඩිහිටියන් පමණක් තරඹනවා ඇති කියායි. ඒත් එය වැරදි අදහසක්.

රෑ 10 පමණ වනතුරුම ළමයින් ටී.වී තරඹනවා. එනිසා අපට කිසිසේත්ම උපකල්පනය කරන්නට බැහැ. රෑ 9-10 වෙද්දී ළමයින් ටී.වී නොබලනවා කියා.

ලංකාවේ ලක්ෂ 23 ක් පමණ රූපවාහිනී ගණනක් තිබෙනවා. ලක්ෂ 110 ක් පමණ දිනපතා රූපවාහිනී තරඹනවා. මින් ලක්ෂ 30 ක් 40 ක් අතර ප්‍රමාණයක් ළමයින්.

ඉතින් අප නිපදවන ඕනෑම වැඩසටහනක් ළමයින්, බැලීමට ඉඩ ඇතැයි කියා අප හිතනවා. ඒ නිසාම ඒ හැම වැඩසටහනකම ළමයින්ට ගත හැකි දෙයක් තිබෙනවා.

**එහෙත් චෝදනාවක් තිබෙනවා නේද කිසිදු රූපවාහිනී නාලිකාවකින් ළමුන්ට සාධාරණයක් ඉටු නොවන බවට.**

එහි කිසියම් සත්‍යතාවක් තිබෙනවා. ළමයින්ගේ ප්‍රමාණයට සාපේක්ෂව වැඩසටහන් කාලසීමා අඩුයි. ඒත් ජාතික රූපවාහිනිය හැකි හැම උත්සහයක්ම ගන්නවා ළමුන් වෙනුවෙන් වැඩි කාලයක් වෙන් කරන්න. ළමයින්ටම වෙන්වූ කාල පරාසයක් තිබෙනවා.

**දැන් පෞද්ගලික අංශවලින් නාලිකා රැසක් බිහිවෙලා. මේ තරගයට කොහොමද ජාතික රූපවාහිනිය මුහුණ දෙන්නෙ?**

ඕනෑම දෙයක් දියුණු වෙන්නේ තරගකාරීත්වයක් පැවතියහොත්. තරගකාරීත්වය නිසා තමයි වෙළෙඳපොල දියුණු වෙන්නෙ. හැබැයි ජාතික රූපවාහිනියට සුවිශේෂ අනන්‍යතාවක් තිබෙනවා. එයට හොඳම උදහරණයක් තමයි පසුගියද පැවති සුමති ටෙලිනාට්‍ය සම්මාන උළෙල. එහිදී සියයට 99 ක් ම ලැබුනෙ ජාතික රූපවාහිනියේ නිෂ්පාදන හා විකාශය වූ ටෙලිනාට්‍යවලට.

අපට තාක්ෂණික අතින් ඉහළ මෙවලම් තිබෙනවා. තවිතම උපකරණ පුහුණුම ශ්‍රමය, ජාත්‍යන්තර නියෝජනය අපටයි. පොදුරාජ්‍ය මණ්ඩල රූපවාහිනී සංගමයේ යාවජීව සාමාජිකත්වය තිබෙන්නේ අපට පමණයි. අධ්‍යාපනික වැඩසටහන් පෙන්වන එකම නාලිකාවත් මෙයයි. වැඩ සටහනවලින් 35% ක් ම ජාතික වැඩසටහන්. එනම් ජන සේවාවන් උදහරණ ලෙස ඩෙංගු ගැන ප්‍රචාරක වැඩසටහන්, වැනි දේ ගත හැකි යි. නයිකැම් තාක්ෂණය (බහුභාෂා) සංඛ්‍යාංකන තාක්ෂණය වැනි දේ අප සතු යි. සංඛ්‍යාංක තාක්ෂණය වෙන අය සතුව නැහැ. 2001 තුළ අපේ මුළු රූපවාහිනී පද්ධතිය ම සංඛ්‍යාංකගත කරනවා.

කළුතර සමහර ප්‍රදේශවලට රූපවාහිනිය හරියට පැහැදිලිව තරඹන්නට හැකිවූයේ නැහැ. ඒ තත්ත්වය මගහැරවීමට තාක්ෂණික පියවර රැගෙන තිබෙනවා.

මේ අවුරුද්දේ දී අප රූපවාහිනී ගම්මානයක් බිහිකරනවා දියගම. වැඩ සටහන් රූගත කිරීමේ පහසුකම්, ඉසව්(location)එහිදී ලබාගත හැකි යි.


S.L.R.(ශ්‍රී ලංකා රිසර්ච් ලිමිටඩ් මගින් පැවැත්වූ ප්‍රේක්ෂක සමීක්ෂණය තුලින් පෙනුණා රත් කාලය තුළදී (Prime time) වැඩිපුර ම තරඹන්නේ අපේ රූපවාහිනිය බව (රත් කාලය යනු සවස 7.00 සිට රාත්‍රී 10.00 දක්වා කාලයයි.)

සෙනසුරාද උදේ 10.00 සිට 10.30 තෙක් සරසවි උයන කියා වැඩ සටහනක් අරඹන්නට සූදනම්. සාහිත්‍ය ඇල්ම සිසුන් තුළ වැඩිකිරීම මෙහි අරමුණ යි. මෙහි සම්පත් දයකයන් ලෙස මහාචාර්ය සුනිල් ආරියරත්න, මහාචාර්ය ජේ.බී. දිසානායක වැනි වියතුන් සහභාගි වෙනවා.

සිකුරාද රෑ 10.00 ට සම්භාව්‍ය සංගීතය අළලා වැඩසටහනක් අරඹන්නට බලාපොරොත්තු වෙනවා. ආධුනික ගීත රචනාවක් ගැන ප්‍රවීණයකු ලවා විචාර ලබාදීමේ ක්‍රමයක් ද මේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක වෙනවා. එක සතියකදී බටහිර සම්භාව්‍ය සංගීතයත් අනෙක් සතියේ දී ලංකාවේ සම්භාව්‍ය සංගීතයත් අළලා වැඩ සටහන් ප්‍රචාරය වෙනවා.

කාලීන මාතෘකා අරභයා විශේෂ වැඩසටහනක් ද සකස් කරන්නට බලාපොරොත්තුවෙනවා.

## පෙළඹවීමේ භාණ්ඩයක් පමණක් වෙලා මදි



**වෙළෙඳසේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් පියදස රත්නසිංහ මහතා - වෙළෙඳ ලෝකය තුළ රූපවාහිනියේ ක්‍රියාකාරීත්වය පැහැදිලි කළේ මෙලෙසයි.**

වයි ඩෝන්ට් යූ ටර්න් ඔෆ් ද ටෙලිවිෂන් ඇන්ඩ් ඩූ සමතින් ඉන්ටරෙස්ටින් ඉන්ස්ටන්ට් - මේ කලකට පෙර බී.බී.සියේ ප්‍රචාරය වූ වැඩසටහනක් ඉලක්කය වූවේ ළමයි. මෙවැන්නක් කළේ රූපවාහිනියෙන් ළමයින්ට ඵලදායී දේ නොපෙන්වයි නම් එය වැසිය යුතුබව කියන්නටයි. බී.බී.සි වැනි ආයතනයක් පවා සැක කරනවා ළමුන්ට නිසි රූපවාහිනී ආවරණයක් නොදෙන බවට. රූපවාහිනිය අද සුවිශේෂ බලපෑම් කරන දෙයක් බවට පත්වෙලා. එක් විචාරකයෙක් කියනවා රූපවාහිනියට පයින් ගහන්න කියා. අද ලොව ප්‍රධාන රූපවාහිනී තරගකාරයන් වන - ටෙඩ් ටර්නර් (CNN)රූපට් මර්ඩොක් ((STARTELE) ලොව තමන් යටතට ගන්න උත්සහ ගන්නවා.

බිල්ගේට් තොරතුරු තාක්ෂණ බලවතා රූපවාහිනියට අභියෝගයක් වෙලා තියෙනවා. ඔහු රූපවාහිනිය කරන දේ පරිගණක මගින් කරනවා. මේ අභියෝග මොනව වුණත් මිනිස්සු රූපවාහිනිය ඉදිරියට රොක්වීම අපට වළක්වන්න බැහැ. වෙළෙඳ දැන්වීම්වල කියන ඒවා ගැන මිනිස්සු තුළ සුබවාදී හැඟීමක් නැහැ. ඒත් ප්‍රචාරයක් නැතිව ලොසින්ජරයක්වත් අලෙවි කරගන්න බැරි බව විචාරක මතයයි. ඒ නිසා පාරිභෝගිකයා පෙළඹවීමේ භාණ්ඩයක් බවට රූපවාහිනිය පත්වෙලා. ප්‍රේක්ෂකයාට වඩා භාණ්ඩ නිෂ්පාදකයා ප්‍රබල වෙනවා. ප්‍රමිතීන් හා අන්තර්ගත මාධ්‍යවල ප්‍රචාරක කටයුතු සඳහා ඇත්තේ සීමිත වෙළෙඳපොළක්. මේ තරගකාරීත්වය තුළ වැඩි ප්‍රතිශතයක් තමන් වෙත ලබා ගන්නට රූපවාහිනී මාධ්‍යවල අය උපක්‍රම යොදනවා. ඒ උපක්‍රමවල බලපෑම එන්නේ ප්‍රේක්ෂකයාට. කවුරුත් කැමැති නැහැ වාර්තා වැඩසටහනකට අනුග්‍රහය දෙන්න. ටොපිවොකල්ට් නිෂ්පාදකයන් පවා කැමති රත් කාලයේ දී ප්‍රචාරය ලබාගන්න. ළමයින් වෙනුවෙන් කාලය වෙන්ව තිබුණත් වැඩිහිටියන්ට තිබෙන වැඩසටහන් ළමයින් බලනවා. මේ බව වෙළෙන්ද් දන්නවා. හොඳ වාර්තා වැඩසටහනකට යන වියදම සංගීත වැඩසටහනකට සාපේක්ෂව විශාලයි. එනිසා සේවාදායකයන් ඒවාට කැමැති නැහැ. ඊට වඩා කැමති ක්‍රිකට් තරගයකට විශාල මුදලක් වැය කරන්නට. මේ තත්ත්වය වෙනස් කරන්නට නම් ආකල්ප වෙනසක් ඇතිවිය යුතුයි. අධ්‍යාපනය දීම රූපවාහිනී බලධාරීන්ගේ අරමුණක් විය යුතුයි. පාඩමක් දීම ම නොවෙයි ළමයින්ගේ රසඥතාව දියුණු කිරීමත් කළ යුතුයි. රූපවාහිනිය තරඹන්න මිනිස්සු ඇබ්බැහි වෙනවා. ඒ ඇබ්බැහිය රූපවාහිනිය මෙහෙයැවීම සඳහා ප්‍රයෝජනයට ගත හැකියි. රූපවාහිනිය හොඳ වැඩසටහන් දෙන්නේ නැති නම් එවෙලේ ප්‍රචාරය වන දෙයක් තරඹනවා. මේවාට තිරසාර වැඩපිළිවෙලක් අවශ්‍යයි. ❑

**මනෝජ් රත්නායක**